අයදුම්පත්‍රය සම්පූර්ණ කර එවීම සඳහා උපදෙස්,

1. තරු (⋆) ලකුණින් දක්වා ඇති කොටස් අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතු අතර, අනෙකුත් කොටස් ද තමන්ට අදාළ වන පරිදි සම්පූර්ණ කළ යුතුය.

2. **මෙහි දී ඔබ විසින් සත්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කළහොත් දීර්ඝ කාලීනව විභාග රාජකාරි තහනමට ලක් කෙරෙනු ඇත.**

3. අයදුම්පත්‍රයේ සියලු ම කොටස් සම්පූර්ණ කර Submit button Click කිරීමෙන් පසු ඔබගේ අයදුම් පත්‍රය PDF ආකාරයට බාගත (Download) කර ගත හැකි වේ. එම අයදුම්පත්‍රයෙහි දෘඪ පිටපතක් (Hard Copy) ඔබ විසින් ලබා ගත යුතුය.

4. එම දෘඪ පිටපතේ සමහර කොටස් අත්අකුරින් සම්පූර්ණ කිරීමට ඔබට සිදුවේ. 10(a) කොටස (කාලසටහන) අත්අකුරින් සම්පූර්ණ කර විදුහල්පති/ නියෝජ්‍ය විදුහල්පති/ සහකාර විදුහල්පති මගින් සහතික කරවා ගත යුතුය. ඔබ ප්‍රධාන පරීක්ෂකවරයකු ලෙස කටයුතු කර ඇත්නම්, ප්‍රධාන පරීක්ෂකවරුන් පිළිබඳ විශේෂ තොරතුරු දැක්වෙන ආකෘති පත්‍රය ද සම්පූර්ණ කර අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

5. මේ දක්වා උත්තරපත්‍ර පරීක්ෂාව සඳහා අවස්ථාව නොලද අයදුම්කරුවන් තමා මේ සඳහා සුදුසුකම් සපුරා ඇති බව සනාථ කිරීමට අදාළ සහතිකවල සහතික කරන ලද ඡායාපිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.

6. **නියමිත පරිදි සම්පූර්ණ කර නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කෙරේ.**

7. අදාළ විදුහල්පති/ ආයතන ප්‍රධානියා විසින් **15 කොටස** සම්පූර්ණ කිරීමෙන් පසු අයදුම්පත්‍රය 2020.07.20 දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

    විභාග කොමසාරිස් ජනරාල්,
    ඇගයීම් (පාසල් විභාග) ශාඛාව,
    ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
    තැ.පෙ. 1503,
    කොළඹ.

8. ලිපිනය ලියූ කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි “උත්තරපත්‍ර පරීක්ෂකවරුන් තෝරා ගැනීම සඳහා අයදුම්පත්‍ර, 5ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2020” යනුවෙන් සඳහන් කළ යුතුය.

9. මීට අමතරව අයදුම්පත්‍රයෙහි 04 වන පිටුවේ සඳහන් උපදෙස් කෙරෙහි ද ඔබගේ අවධානය යොමු කළ යුතු වේ.

10. ඔබට අමතර වශයෙන් උපදෙස් අවශ්‍ය වුවහොත් පහත සඳහන් දුරකථන අංකවලට අමතන්න.

| | | |
|---|---|---|
| ඩී.පී.ආර්.ධර්මගුණ | -විභාග කොමසාරිස් (ඇගයීම් පා.වි.) | -0112784037 |
| එල්.ජී.එස්.සමරකෝන් | -(නියෝජ්‍ය විභාග කොමසාරිස්) | -0112785216 |
| එස්.පී. ආරියරත්න | -(නියෝජ්‍ය විභාග කොමසාරිස්) | -0112785231 |
| ඒ.ආර්.කේ.පීරිස් | -(සහකාර විභාග කොමසාරිස්) | -0112785231 |
| ඒ.ක්‍රිෂ්ණගෝපි | -(සහකාර විභාග කොමසාරිස්) | -0112785216 |